කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

කාර්ය පත්‍රිකාව

විෂය- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

දත්ත සමුදාය පද්ධතියක ප්‍රධාන සංරචක විශ්ලේෂණය කරයි.

ශ්‍රේණිය - 13

පාඩම - 8

නිපුණතා මට්ටම 8.6 – දත්ත සමුදාය පද්ධතියක ප්‍රධාන සංරචක විශ්ලේෂණය කරයි.

දත්ත සමුදාය කළමණාකරණ පද්ධති -

දත්ත සමුදාය නිර්මාණය කිරීම සහ කළමණාකරණය කිරීම සඳහා භාවිතා කරන මෘදුකාංග පද්ධතියකි.

උදා - Oracle,MS Access,MS SQL,MySql,Dbase

SQL (Structured Query Language)

දත්ත සමුදාය නිර්මාණය සහ කළමණාකරණය සඳහා භාවිතා කරන විමසුම් භාෂාවකි.DDL (Data Definition Language) සහ DML (Data Manipulation Language) ලෙස කොටස් දෙකක් ඇත.

- DDL මගින් දත්ත සමුදාය තුළ වස්තූන් නිර්මාණය කරයි.
- DML මගින් දත්ත සමුදාය තුළ දත්ත කළමණාකරණය කරයි.

අභ්‍යාස

1.දත්ත කළමණාකරණ මෙහෙයුම් තුළ අඩංගු මෙහෙයුම් මොනවාද?

2.දත්ත පාදක සඳහා ලබා දිය හැකි විවිධ ආරක්ෂක විධි ක්‍රම මොනවාද?